# කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

# තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ආරක්ෂක කළමනාකාර (Security Manager)**

**කළමනාකාර සේවා ශ්‍රේණිය (MM-1-1)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**01. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

**සහ**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය පොලිස් සේවයේ / හමුදා සේවයේ / පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කනිෂ්ඨ කළමනාකාර (JM 1-2) සේවා ශ්‍රේණියෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**MM -1-1, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය -** MM -1-1, රු.53,175/-, 1,375X10 1,910X15=95,575/-

රු.53,175/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

**වයස් සීමාව :** අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**දීමනා හා ප්‍රතිලාභ**

**දීමනා**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු.17,800/- වන ජීවන වියදම් දීමනාව
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරිදීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු.4,000/- වන දුෂ්කර දීමනාව
05. මාසික නිෂ්පාදනය මත ගෙවනු ලබන නිෂ්පාදන දිරි දීමනාව
06. රු.5,000/- වන මාසික අන්තර්දීමනාව
07. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම
08. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රිය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.
09. භාණ්ඩාගාරය අනුමත කළ රු.1,800/- වන මාසික ප්‍රවාහන දීමනාව

**ප්‍රතිලාභ**

01. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)

**02. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය**

i. වසරක් සඳහා රු.200,000/- ක රෝහල් ගත වීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)

ii. වසරක් සඳහා රු.20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)

iii. වසරක් සඳහා රු.5,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)

**03. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම.**

i. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසර දෙකකට වරක් රු.12,000/- ක දීමනාව.

ii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/- මුදලක් ලබා දීම.

04. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.

05. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10% ක්ද,සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
4. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ මුලු ඉපයීම්වලින් උපයන විට ගෙවීම් බද්ද (Pay as You Earn Pay Tax) අය කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඊමේල් ලිපිනය ද ඇතුළත් කර ඔබගේ අත්සන සහිතව අයදුම්පත එවිය යුතු අතර, ඔබගේ අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සියලුම අධ්‍යාපන, වෘත්තීය හා සේවා සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත් ඒ සමග එවිය යුතුවේ. (නිසි පරිදි සහතික පත්‍රවල ඡායා පිටපත් යොමු කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඔබ විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2025 ජනවාරි මස 30 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු කළ යුතු වේ.

**සභාපති**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්**
**අංක 341/13, සරණ මාවත, රාජගිරිය.**